*PRAVACANA: The Journal of Bhiksu University of Sri Lanka, Vol. 17-Iss.I, June 2026, 133-145.*
*DOI: https://doi.org/10.4038/p.v17i1.90*

# ග්‍රාමීය පාසල්වල ජ්‍යෙෂ්ඨ ද්විතීයික සිසුන්ගේ ඉංග්‍රීසි විෂය ඉගෙනුම කෙරෙහි බලපාන ගැටලු

# [Issues Impacting English Language Learning among Senior Secondary Students in Rural Schools]

**Madugalle Sudaththa**[1]
**Kukurampola Suneetha**[2]

## Absract

In the modern era, the world is developing a globally interconnected economy alongside political networks, making it essential for learners to develop strong communication and problem-solving skills, for which the English language has become an indispensable medium. Although English has been taught as a compulsory second language since 1943, a significant majority of the student population, particularly senior secondary students in rural schools, has failed to achieve proficiency - a situation far more prevalent in rural areas than in urban ones. This study employed a mixed-methods research approach to analytically investigate the problems affecting English language learning among these students, utilizing questionnaires and interviews as primary instruments and written sources for secondary data. The research sample, selected via simple random sampling, consisted of five principals, five teachers of Grades 10 and 11, and 80 senior secondary students from Category 02 schools within the Buttala Education Division of the Monaragala District. Quantitative data were analyzed using tables, charts, and percentages, while qualitative data were analyzed through thematic analysis. The findings revealed that English achievement levels among these students are below 50%, with a vast majority expressing dissatisfaction with their marks. Furthermore, the study identified a critical lack of use of learning aids and a heavy reliance on the traditional lecture-discussion method. To address these issues, the research suggests that teachers emphasize the value of English to students, increase the use of instructional aids, assess performance across all four language skills, and implement feedback programs and subject-related workshops to enhance overall student achievement.

**Keywords**: English language, rural schools, senior secondary grades, student achievement, teaching-learning process

---

1. Lecturer, Department of Social Sciences and Comparative Studies, Bhiksu University of Sri Lanka.
   E-mail: sudaththam@busl.ac.lk https://orcid.org/0009-0005-5737-5916
2. BEd Hons, Bhiksu University of Sri Lanka.

Received: 10 February 2026, Accepted revised version: 12 May 2026.
This work is licensed under a Creative Commons Attribution-Share A like 4.0 International License.

## හැඳින්වීම

දැනුම් ආර්ථිකයකට මඟ පෙන්වන නූතනයේ ගෝලීයකරණයත් සමඟ ඉංග්‍රීසි භාෂාව අත්‍යවශ්‍ය ය. යටත් විජිතවාදයේ ප්‍රතිඵලයක් ලෙස ඉංග්‍රීසි භාෂාව මෙරටට උරුම වුව ද වර්තමානය වන විට ලොව සෑම ක්ෂේත්‍රයක ම ප්‍රධාන සන්නිවේදන මාධ්‍යය බවට එය පත් ව ඇත. ක්‍රි.ව. 1948 දී සී.ඩබ්.ඩබ්. කන්නංගර විසින් හඳුන්වා දුන් නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමත් සමඟ සියලු ම දේශීය ශිෂ්‍යයන්ට ඉංග්‍රීසි භාෂාව අන්තර්ගත විෂයමාලාවක් කිසිදු ගෙවීමකින් තොර ව ඉගෙනීමට අවස්ථාව සැලසිණි. සමාජ, ආර්ථික, දේශපාලන අවශ්‍යතා මත ඉංග්‍රීසි භාෂා විෂයය කාලානුරූපී ව විවිධ ප්‍රතිසංස්කරණවලට භාජනය විය. ඉංග්‍රීසි භාෂාව අනිවාර්ය දෙවන භාෂාවක් ලෙස ඉගැන්වීම ආරම්භ වී වර්තමානය වන විට බොහෝ කලක් ගත වුව ද ඉංග්‍රීසි භාෂා හැකියාව ප්‍රගුණ කිරීමට ශ්‍රී ලාංකේය බහුතර ශිෂ්‍ය ප්‍රජාවකට නොහැකි වී තිබේ. නාගරික පාසල්වල සිසුන්ගේ ඉංග්‍රීසි විෂය සාධනය ඉහළ මට්ටමක තිබුණ ද ග්‍රාමීය පාසල්වල සිසුන්ගේ සාධන මට්ටම අඩු බවක් දක්නට ලැබේ. ඒ අනුව මෙම පර්යේෂණයෙන් ග්‍රාමීය පාසල්වල සිසුන්ගේ ඉංග්‍රීසි විෂය ඉගෙනුම කෙරෙහි බලපාන ගැටලු කවරේ ද? යන්න විමර්ශනාත්මක ව අධ්‍යයනය කිරීමට අපේක්ෂිත ය.

## සාහිත්‍ය විමර්ශනය

මෙම පර්යේෂණයට සමගාමී ව සිදු වී ඇති පූර්ව පර්යේෂණ කිහිපයක් හඳුනාගත හැකි විය.

රූබේරු (2004) විසින් රචිත 'ශ්‍රී ලංකා ජාතික අධ්‍යාපන ගැටලු' නමැති කෘතියේ ඉංග්‍රීසි භාෂා විෂය පිළිබඳ කරුණු පැහැදිලි කරයි. 'පාසල් ඉගෙනීම අවසාන කර පාසල් හැර යන ශිෂ්‍යයන්ගේ ප්‍රවීණතාව පහළ මට්ටමක ඇති බවත් වසර දහයකට වැඩි කාලයකුත් දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි භාෂාව නිවැරදි ලෙස භාවිත කිරීමට නොහැකි වූ විට පෙනී යන්නේ පාසල්වල දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම නිසි අන්දමට සිදු නොවන බව යි'. ඉංග්‍රීසි භාෂා ග්‍රහනය පිළිබඳ දක්වන අදහසින් පැහැදිලි වන්නේ ශ්‍රී ලංකාවේ විෂය ඉගැන්වීම නිසි ආකාරයෙන් සිදු නොවන බව යි. එලෙස ම මෙම දුර්වලකම පෙනෙන්නේ ශිෂ්‍යයන් පාසල් හැරගොස් රැකියා සොයා ගැනීමට ඉදිරිපත් වූ පසු බව ද ඔහු විසින් පෙන්වා දී ඇත. ඔහු තවදුරටත් පැහැදිලි කරන්නේ ශ්‍රී ලාංකේය විශ්වවිද්‍යාලයීය විෂයමාලාවල ඉංග්‍රීසි භාෂාව සඳහා වැදගත් ස්ථානයක් සපයා නොමැතිකම නිසා විශ්වවිද්‍යාලයෙන් පිටවන්නා වූ උපාධිධාරීන්ගේ ඉංග්‍රීසි භාෂා දැනුම සහ ඉංග්‍රීසි භාෂා ප්‍රවීණත්වය පවතින්නේ අවම මට්ටමක බව යි.

පෙරේරා (1991) විසින් රචිත 'විස්තරාත්මක අධ්‍යාපනික සංඛ්‍යානය' කෘතියෙන් ශ්‍රී ලංකාවේ ග්‍රාමීය පාසල්වල ඉංග්‍රීසි ගුරුවරුන්ගේ හිඟතාව දිගුකාලීන ගැටලුවක් බව පර්යේෂණ මඟින් හෙළි වී ඇති බව සඳහන් කරයි. සුදුසුකම් ලත් සහ පළපුරුදු ඉංග්‍රීසි ගුරුවරුන් නාගරික ප්‍රදේශවලට සංකේන්ද්‍රණය වීමත්, ග්‍රාමීය පාසල්වලට ගුරුවරුන් බඳවා ගැනීමේ සහ රඳවා ගැනීමේ දුෂ්කරතාත් මෙයට හේතු වී ඇති බව ද ග්‍රාමීය ගුරුවරුන්ට ඔවුන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා ඇති අවස්ථා සීමිත වීම නිසා ඔවුන්ගේ ඉගැන්වීමේ කාර්යක්ෂමතාවට බලපෑම් එල්ල වී ඇති බව ද ප්‍රකාශ කරයි.

'ඉංග්‍රීසි භාෂාව සාර්ථක ව ඉගෙනීමට යොමු කිරීම' පිළිබඳ 7 වන ශ්‍රේණිය ආශ්‍රයෙන් මැණිකේ (2002) විසින් සිදු කරන ලද අප්‍රකාශිත නිබන්ධනයෙන් පෙන්වා දෙන්නේ දෙවන භාෂාවක් වශයෙන් රජයේ සියලු ම පාසල්වල ඉංග්‍රීසි විෂය උගන්වනු ලැබුව ද විෂයෙහි ප්‍රතිඵල අඩු බවත් ගම්බද

ශිෂ්‍යයන් අපේක්ෂිත ප්‍රවීණතා මට්ටමට ළඟා වී නොමැති බවත් ඉංග්‍රීසි භාෂාවෙන් අපේක්ෂිත ගුරු කාර්යභාරය මැනවින් ඉටු නොවන බවත් ය.

අබේපාල (2010) විසින් රචිත 'අධ්‍යාපනයේ මනෝ විද්‍යාත්මක පදනම' කෘතියේ දක්වන පරිදි පළමුවන ප්‍රධාන අවධියේ පසුවන දරුවන්ගේ ඉංග්‍රීසි වාචික හැකියා දුර්වල වීමට නිවසෙහි පරිසරයෙන් ශිෂ්‍යයාට ලැබෙන ඉංග්‍රීසි භාෂාමය පිටුවහල හේතුවක් වේ. එම ශිෂ්‍යයන්ගේ බහුතරයක් දෙනාගේ දෙමාපියන් නිවසේ දී සිංහල භාෂාව පමණක් භාවිත කිරීම ද ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දැනුම අවම වීමට හේතුවක් වන බවට පෙන්වා දී ඇත. තව ද පහළ ආර්ථික මට්ටම, ඉංග්‍රීසි භාෂා පොතපත හා ඒ ආශ්‍රිත සවන්දිය හැකි පරිසරයක් ගොඩනගා දීමට අපොහොසත් වීම ද මේ සඳහා බලපාන ලද හේතු සාධක ලෙස ඔහු අනාවරණය කර ඇත.

තව ද 'අවිධිමත් අංශයේ ඉංග්‍රීසි භාෂා ඉගෙනීමේ පංති කාමර සම්බන්ධිත සිද්ධි අධ්‍යයන තුනක්' ඇසුරින් කරන ලද පර්යේෂණයකින් රණසිංහ (1997) දක්වන්නේ සමාජ ආර්ථික තත්වයන්ගේ වැඩි වාසියක් අත්පත් කර ගනුයේ ඉංග්‍රීසි භාෂාව හසුරුවන ඉහළ පාන්තික පුද්ගලයන් බව ය.

ඉහත සඳහන් කෘති සහ නිබන්ධන මඟින් අනාවරණිත කරුණු අනුව පැහැදිලි වන්නේ නූතනයේ ඉංග්‍රීසි භාෂා විෂය සම්බන්ධ යම් ගැටලු සහගත බවක් ප්‍රදර්ශනය වන බවත් ග්‍රාමීය පාසල්වල සිසුන්ගේ ඉංග්‍රීසි භාෂා කුසලතාව පිළිබඳ පර්යේෂණ සිදු වී ඇති ප්‍රමාණය යම් තරමක අඩු බවත් ය.

### පර්යේෂණ ගැටලුව හැඳින්වීම

ඉංග්‍රීසි භාෂාව ශ්‍රී ලාංකේය පාසල් ශිෂ්‍යයන්ට ප්‍රාථමික අවධියේ පටන් ම විෂයයක් ලෙස සමීප වුව ද ඉංග්‍රීසි භාෂා සාධනය තවමත් සැලකිය යුතු මට්ටමක් දක්වා ඉහළ ගොස් ඇති බවක් නිරූපණය නොවේ. අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයෙන් පසු පාසලින් පිට වන ශිෂ්‍යයා රැකියා ලෝකයට පිවිසීමේ දී ඉංග්‍රීසි භාෂා නිපුණතාව නොමැති වීමෙන් විවිධ ගැටලු සහගත තත්වයන්ට මුහුණපානු ඇත. රුබේරු (2004) විසින් ඉදිරිපත් කරන අදහසින් එය තව දුරටත් පැහැදිලි වේ. ''පාසල් ඉගෙනීම අවසන් කර පාසල් හැර යන ළමයින්ගේ ඉංග්‍රීසි ප්‍රවීණතාව පහත් මට්ටමක ඇති යැයි පොදු චෝදනාවක් අද ප්‍රකාශ වේ. ඇත්ත වශයෙන් ම වර්ෂ දහයකට වැඩි කාලයක් දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි භාෂාව නිවැරදි ලෙස භාවිත කිරීමට නොහැකි වූ විට පෙනී යන්නේ පාසල්වල දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම නිසි අන්දමට සිදු නොවන බවයි. එම දුර්වලකම පෙනෙන්නේ ළමයින් පාසල් හැර ගොස් රැකියා සොයා ගැනීමට ඉදිරිපත් වූ විට ය.''

නාගරික පාසල්වලට සාපේක්ෂ ව ග්‍රාමීය පාසල්වල දරුවන්ගේ ඉංග්‍රීසි විෂය කෙරෙහි අඩු කුසලතාවක් ප්‍රදර්ශනය වේ. එහෙත් නාගරික පාසල් හා ග්‍රාමීය පාසල් යන දෙපිරිසේ ම බිහි වන දරුවන් පාසල් අධ්‍යාපනයෙන් පසු ව එකම සමාජයකට එකතු වේ. ග්‍රාමීය පාසල්වලින් පිටවන දරුවාට රැකියා ලෝකයේ දී ඉංග්‍රීසි භාෂා බාධකය නිසා විවිධ ගැටලුවලට මුහුණ දීමට සිදු වනු ඇත. මෙම තත්වය අවම කර ගැනීම උදෙසා ග්‍රාමීය පාසල්වල දරුවන් ද ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණයන් කළ යුතු ය. ඒ අනුව ග්‍රාමීය පාසල්වල සිසුන්ගේ ඉංග්‍රීසි විෂය ඉගෙනුම කෙරෙහි බලපාන ගැටලු කවරේ දැ'යි අධ්‍යයනය කර ඒ සඳහා විසඳුම් ඉදිරිපත් කිරීම මෙම පර්යේෂණයෙන් අපේක්ෂා කෙරේ.

### පර්යේෂණයේ ප්‍රධාන අරමුණ

මෙම අධ්‍යයනයේ දී ග්‍රාමීය පාසල්වල ජ්‍යෙෂ්ඨ ද්විතීයික ශ්‍රේණිවල සිසුන්ගේ ඉංග්‍රීසි විෂය ඉගෙනුම කෙරෙහි බලපාන ගැටලු කවරේ දැ'යි විමර්ශනාත්මක ව අධ්‍යයනය කර, විෂය සාධනය ඉහළට ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග සොයා බැලීම ප්‍රධාන අරමුණ වේ.

### පර්යේෂණයේ සුවිශේෂ අරමුණු

- 10-11 ශ්‍රේණිවල ශිෂ්‍යයන්ගේ ඉංග්‍රීසි විෂය සාධන මට්ටම් හඳුනා ගැනීම
- ජ්‍යෙෂ්ඨ ද්විතීයික ශ්‍රේණිවල සිසුන් ඉංග්‍රීසි විෂය කෙරෙහි දක්වන ආකල්ප හඳුනා ගැනීම
- ඉංග්‍රීසි විෂය ඉගෙනුම කෙරෙහි බලපාන වෙනත් සාධක හඳුනා ගැනීම
- ඉංග්‍රීසි විෂය ඉගෙනුමෙහි සාර්ථකත්වය සඳහා ගත හැකි ක්‍රියාමාර්ග යෝජනා කිරීම

### පර්යේෂණ ක්‍රමවේදය

පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් ගුණාත්මක හා ප්‍රමාණාත්මක පර්යේෂණ ක්‍රමවේද දෙකෙහි එකතුවක් වන මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය යොදා ගන්නා ලදි. විදුහල්පතිවරුන්ගේ දත්ත ලබා ගැනීම සඳහා සම්මුඛ සාකච්ඡා ක්‍රමය ද ගුරුවරුන් සඳහා ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා ද ශිෂ්‍යයන් සඳහා ප්‍රශ්නාවලියක් ද ලබා දෙන ලදි. ද්විතීයික මූලාශ්‍රය ලෙස පූර්ව පර්යේෂණ අධ්‍යයන වාර්තා, සටහන්, පොත් පත් සමගාමී මාර්ගෝපදේශ, අත් පොත් ආදි සාහිත්‍යය ද අන්තර්ජාලය ද යොදා ගන්නා ලදි. පර්යේෂණය සඳහා මොනරාගල දිස්ත්‍රික්කයේ, වැල්ලවාය අධ්‍යාපන කලාපයේ, බුත්තල අධ්‍යාපන කොට්ඨාසයේ '02 වර්ගයට' අයත් පාසල් 12 අතුරින් පාසල් 05ක් පහසු නියැදිකරණ ක්‍රමය යටතේ තෝරා ගන්නා ලදි. මෙහි දී නියැදිය ලෙස පාසල් පහේ විදුහල්පතිවරුන් පස් දෙනා ද ගුරු නියැදිය ලෙස පාසල් පහේ 10-11 ශ්‍රේණිවල ඉංග්‍රීසි භාෂාව උගන්වනු ලබන ගුරුවරුන් 05 දෙනෙක් ද ශිෂ්‍ය නියැදිය ලෙස එම පාසල්වල අධ්‍යාපනය ලබන 10 ශ්‍රේණියේ ළමයින් අටදෙනකුත්, 11 ශ්‍රේණියේ ළමයින් අටදෙනකුත් වන පරිදි පාසල් පහෙන් ශිෂ්‍යයන් 80 දෙනෙක් ද යොදා ගෙන ඇත. ලබාගත් දත්තවලට අනුව ගුණාත්මක දත්ත තේමාපාදක ව විශ්ලේෂණයට ලක් කරනු ලැබූ අතර ප්‍රමාණාත්මක දත්ත සංඛ්‍යා විද්‍යාත්මක ව Excel භාවිත කර ප්‍රතිශත, වගු හා ප්‍රස්තාර ආදි සංඛ්‍යාමය දත්ත ඔස්සේ විශ්ලේෂණය කරන ලදි.

### පර්යේෂණයේ වැදගත්කම

ශ්‍රී ලංකාවේ පාසල් ශිෂ්‍යයන්ගේ ඉංග්‍රීසි භාෂා නිපුණතාව අඩු වීමට හේතු විමසා බලා ගැටලු අනාවරණය කර, ඒ සඳහා පිළියම් ඉදිරිපත් කරන මෙම පර්යේෂණය අධ්‍යාපන ක්ෂේත්‍රයට ඉතා වැදගත් වනු ඇත. ළමයින්ගේ අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වර්ධනය කිරීමටත් පාසල්වල ඉංග්‍රීසි භාෂා ඉගෙනුම් ක්‍රියාවලිය නව ශිල්ප ක්‍රම ඔස්සේ ලබා දීමටත් ගුරුවරුන්ට මෙය ඉතා වැදගත් ය. එසේ ම නව මුහුණුවරකින් සිය ඉංග්‍රීසි අධ්‍යාපන ක්‍රියාවලිය වර්ධනය කර ගැනීමට පාසල් ශිෂ්‍යයන්ට හා සිසුන්ගේ අධ්‍යාපනය ඉහළ නැංවීමට අපේක්ෂිත සියලු පාර්ශ්වයන්ට ද මෙය ඉතා වැදගත් පර්යේෂණයක් වනු ඇත.

### 10-11 ශ්‍රේණිවල ශිෂ්‍යයන්ගේ ඉංග්‍රීසි විෂය සාධන මට්ටම් හඳුනා ගැනීම

ශිෂ්‍යයන්ගේ ඉංග්‍රීසි විෂය සාධන මට්ටම් හඳුනා ගැනීම සඳහා තෝරාගත් පාසල් 05හි 10-11 ශ්‍රේණිවල ශිෂ්‍යයන්, එක් ශ්‍රේණියකින් 10 බැගින් ගෙන වාර පරීක්ෂණයේ දී ඉංග්‍රීසි විෂයයට ළමයින් ලබාගත් ලකුණු විමර්ශනය කරන ලදි. එහෙත් සමහර පාසල්වල වාර පරීක්ෂණ ප්‍රතිඵල පිළිබඳ

නිශ්චිත තොරතුරක් ලබා ගැනීමට නොහැකි වූ බැවින් එම එක් එක් පාසලේ පසුගිය වසර 5 ක අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයට ශිෂ්‍යයන් ලබාගත් ලකුණු වාර්තාවන් විශ්ලේෂණයට බඳුන් කරන ලදි.

ප්‍රස්තාරය 1ට අනුව ඉංග්‍රීසි විෂය සමත් වීමේ ප්‍රතිශතය 50% ඉක්මවා යාමට ආසන්න වසර පහ තුළ නියැදිය ලෙස තෝරාගත් කිසිදු පාසලකට හැකියාව ලැබී නොමැත. එසේ ම ඉංග්‍රීසි විෂය සඳහා වසර 05 තුළ 'A' සාමර්ථ්‍යයන් ලබාගෙන තිබුණේ නියැදියේ පිරිවෙන්වල සිසුන් දෙදෙනෙකු පමණි. එය ප්‍රතිශතයක් ලෙස 0.64% කි.




ප්‍රස්තාරය 1 - අ.පො.ස. (සා.පෙළ) ශිෂ්‍යයන්ගේ ඉංග්‍රීසි ලකුණු 2019 - 2023

'B' සාමර්ථ්‍යය ද මෙම වසර 05 තුළ එනම් 2019 සිට 2023 දක්වා වසර පහ තුළ ලබා ගෙන තිබුණේ සිසුන් තිදෙනෙකු පමණි. එසේ ම එක් පාසලක් වසර දෙකක දී ම ඉංග්‍රීසි විෂය සමත් වීමේ ප්‍රතිශතය ලෙස ගෙන තිබුණේ 0%ක අගයකි. ලකුණු විමර්ශනය කරනු ලැබූ වසර 05 තුළ නියැදියේ පාසල් අවස්ථා 19 ක දී ම විෂය සමත් වීමේ ප්‍රතිශතය 30% ඉක්මවා ගොස් නැත. එය නියැදියෙන් 76% ක ප්‍රතිශතයකි. 30% සිට 50% දක්වා සමත් වීමේ ප්‍රතිශත අවස්ථා 06ක් පමණක් තිබුණි. එය ප්‍රතිශතයක් ලෙස දැක්වූ විට නියැදියෙන් 24%කි.

ප්‍රස්තාර 2 අනුව ලකුණු විශ්ලේෂණය කළ වසර පහ තුළ සමස්තයක් ලෙස ඉංග්‍රීසි විෂය සමත් වීමේ ප්‍රතිශතය 20.72%කි. අසමත් වීමේ ප්‍රතිශතය 79.28% කි. ඒ අනුව ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ග්‍රාමීය පාසල්වල සිසුන්ගේ සාධන මට්ටම ඉතා අඩු බව අනාවරණය වේ.




ප්‍රස්තාර 2 - අ.පො.ස (සා.පෙළ) ශිෂ්‍යයන්ගේ ඉංග්‍රීසි ලකුණු විමර්ශනය

**ජ්‍යෙෂ්ඨ ද්විතීයික ශ්‍රේණිවල සිසුන් ඉංග්‍රීසි විෂය කෙරෙහි දක්වන ආකල්ප හඳුනා ගැනීම**

ග්‍රාමීය පාසල්වල ජ්‍යෙෂ්ඨ ද්විතීයික ශ්‍රේණිවල සිසුන්ගේ ඉංග්‍රීසි භාෂා ඉගෙනුම සඳහා බලපානු ලබන ආකල්ප කවරේ ද? යන්න විමර්ශනය කිරීම මෙම තේමාව යටතේ අපේක්ෂිත ය.

- **ශිෂ්‍යයන්ගේ විෂය සහභාගිත්වය**

පර්යේෂණයෙන් ලබාගත් දත්ත වාර්තාවන්ට අනුව ශිෂ්‍යයන් 100න් යුත් නියැදියෙන් 60%ක ශිෂ්‍ය ප්‍රතිශතයක් ඉංග්‍රීසි කාලච්ඡේද සඳහා දිනපතා පංතිවලට සහභාගි වේ. වරින්වර සහභාගි වන ශිෂ්‍යයන්ගේ ප්‍රතිශතය 20%කි. කලාතුරකින් සහභාගි වන ශිෂ්‍යයන්ගේ ප්‍රතිශතය ද 20%කි. කිසිදු අයෙක් ඉංග්‍රීසි කාලච්ඡේද සඳහා සහභාගි නොවී නො සිටිති. ඒ අනුව පැහැදිලි වන්නේ බොහෝ ශිෂ්‍ය ප්‍රමාණයක් ඉංග්‍රීසි විෂය සඳහා අනිවාර්යයෙන් සහභාගි වන බව යි. එය ප්‍රස්තාරය 03න් දැක්විය හැකි ය.




ප්‍රස්තාරය 3 - ඉංග්‍රීසි විෂය සඳහා ශිෂ්‍ය සහභාගීත්වය

සම්මුඛ සාකච්ඡා ඔස්සේ ශිෂ්‍යයන්ගෙන් ලබා ගත් දත්ත අනුව පැහැදිලි වන්නේ ශිෂ්‍යයා පාසලට පැමිණ තිබේ නම් කාලච්ඡේදයට අනිවාර්යයෙන් ම සහභාගී වන බව යි. ඒ කුමන හේතුවක් නිසාදැයි යන ප්‍රශ්නය විමසූ විට එක් සිසුවෙකු ප්‍රකාශ කර සිටියේ "නැත්නම් ටීචර්ගෙන් ගුටිකන්න වෙනවා, ලොකු සර් ළඟටත් යවනවා'' යනුවෙනි. තවත් සිසුන් කීප දෙනෙකුගේ ම පිළිතුරු මේ හා සමාන විය. ඒ අනුව සමස්තයක් ලෙස ඉංග්‍රීසි විෂයය සඳහා ශිෂ්‍ය සහභාගීත්වය සතුටුදායක මට්ටමක පවතින බව පැහැදිලි විය.

- **ශිෂ්‍යයන් විෂය ඉගෙනීමට දක්වන රුචිකත්වය**

ශිෂ්‍ය සහභාගිත්වය ඉහළ මට්ටමක් ගනු ලැබුවත් එම සහභාගිත්වයේ රුචිකත්වය කුමන ආකාරයක ස්වභාවයකින් යුතු ද යන්න හඳුනා ගැනීම සඳහා ලබාගත් දත්ත පහත වගුව 1න් දැක්වේ.

වගුව 1ට අනුව මුළු ශිෂ්‍යයන්ගෙන් 46.25%ක ප්‍රතිශතයක් ඉංග්‍රීසි විෂයයට මධ්‍යස්ථ රුචිකත්වයකින් යුතුව සහභාගි වන බව දක්වා තිබේ. එසේ ම 12.5%ක ප්‍රතිශතයක් ඉතා කැමැත්තෙන් සහභාගී වේ. අකමැත්තෙන් සහභාගී වන ශිෂ්‍ය ප්‍රතිශතය 10%කි. නියැදියෙන් විෂයයට ඉතා අකමැත්ත සහිත ශිෂ්‍යයන් සිටියේ එක් අයෙකු පමණි. එය ප්‍රතිශතයක් ලෙස දැක්වූ විට 1.25%කි. මෙකී දත්ත විමර්ශනය කිරීමේ දී පැහැදිලි වන්නේ වැඩි ශිෂ්‍ය ප්‍රතිශතයක් ඉංග්‍රීසි විෂයට රුචිකත්වයක් දක්වන බව යි. මීට අමතර ව නිරූපණය වන තවත් කරුණක් නම් ඉංග්‍රීසි විෂය සඳහා ඉතාමත් අකමැති ශිෂ්‍යයන් සහ ඉතාමත් කැමති ශිෂ්‍යයන් ප්‍රමාණය අඩු බව යි.

වගුව 1- ශිෂ්‍යයන් විෂය ඉගෙනීමට දක්වන රුචිකත්වය

| ශිෂ්‍ය නියැදිය | ඉතා කැමැත්තෙනි | | කැමැත්තෙනි | | මධ්‍යස්ථය | | අකමැත්තෙනි | | ඉතා අකමැත්තෙනි | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ශිෂ්‍ය | ප්‍රතිශතය | ශිෂ්‍ය | ප්‍රතිශතය | ශිෂ්‍ය | ප්‍රතිශතය | ශිෂ්‍ය | ප්‍රතිශතය | ශිෂ්‍ය | ප්‍රතිශතය |
| 80 | 10 | 12.5% | 24 | 30% | 37 | 46.25% | 8 | 10% | 1 | 1.25% |

මූලාශ්‍රය - ක්ෂේත්‍ර අධ්‍යයනය, 2025

- **පන්ති කාමරය තුළ ඉංග්‍රීසි විෂය කාලච්ඡේදය දරුවන්ට හැඟෙන ආකාරය**

පර්යේෂණ අධ්‍යයනය තුළ දී ඉංග්‍රීසි විෂය ඉගෙනුමට බලපානු ලබන සාධක කවරේ ද? යන්න හඳුනා ගැනීම සඳහා මූලික වශයෙන් ම පන්ති කාමරය තුළ ඉංග්‍රීසි විෂය කාලච්ඡේදය දරුවන්ට හැඟෙන්නේ කෙසේ දැ'යි යන්න විමසීමෙන් ලද ප්‍රතිචාරයන් පහත ප්‍රස්තාරය 4න් දක්වා ඇත.




ප්‍රස්තාරය 4 - පන්ති කාමරය තුළ ඉංග්‍රීසි විෂය කාලච්ඡේදය දරුවන්ට හැඟෙන ආකාරය

ඒ අනුව ඉතා ප්‍රබෝධමත් ලෙස හෝ ඉතා අලස ලෙස කිසිවෙකුටත් ඉංග්‍රීසි විෂය කාලච්ඡේදය නො හැඟෙන බව දක්වා ඇත. 49%ට මධ්‍යස්ථ ආකාරයෙන් හැඟෙන බවත් 44%ක් ප්‍රබෝධමත් ආකාරයෙන් හැඟෙන බවත් 7%ක් අලස ලෙස හැඟෙන බවත් දක්වා ඇත.

එමෙන් ම ශිෂ්‍යයන්ගෙන් විෂය කාලච්ඡේදය දැනෙන ආකාරය සහ එසේ දැනීමට හේතුව ප්‍රශ්නාවලියේ දී විමසන ලදී. "ටීචර් හොඳට කියලා දෙනවා", "ටීචර් උගන්වනවා තේරෙනවා, ඒ නිසා පන්තියේ ඉන්න ආසයි", "ඉංග්‍රීසිවලට ආස නෑ, නින්ද යනවා", "ටීචර් හරි හොඳයි", "ටීචර් හරි හොඳයි, ඒත් ඉංග්‍රීසිවලට ආස නෑ"

මෙලෙසින් සිසුන් ලබා දී තිබූ පිළිතුරු පරීක්ෂා කිරීමේ දී නියැදියෙන් 50%ක් පමණ ප්‍රතිචාර දක්වා තිබුණේ, ගුරුවරයා උගන්වන දේ තේරුණත් ඉංග්‍රීසි විෂයයට ඇති අකමැත්ත නිසා ඉංග්‍රීසි විෂයයට මධ්‍යස්ථ ලෙස සහභාගි වන බව යි.

මේ පිළිබඳ ගුරුවරුන් සමග කළ සම්මුඛ සාකච්ඡාවේ දී ද විමසන ලදී. එහිදී B පාසලේ ගුරුවරයා පැවසුවේ, "ළමයි පන්ති කාමරයේ වැඩ කරන්නේ මධ්‍යස්ථ විදිහට, ගොඩක් ප්‍රබෝධමත්ව ඉන්න ළමයි නම් ඇත්තේ ම නැති තරම්" වශයෙනි. මේ පිළිබඳ ව විමසන ලද අනෙකුත් ගුරුවරුන්ගේ ද අදහස වූයේ ළමයි බහුතරය මධ්‍යස්ථ ලෙස විෂය කාලච්ඡේදයට සම්බන්ධ වන බව යි.

ඒ අනුව පැහැදිලි වන්නේ සමස්තයක් ලෙස ශිෂ්‍යයන් මධ්‍යස්ථ හැඟීමකින් යුතු ව ඉංග්‍රීසි විෂය කාලච්ඡේදය සඳහා සහභාගී වන බව යි.

## ඉංග්‍රීසි විෂය ඉගෙනුම කෙරෙහි බලපාන වෙනත් සාධක

- **දෙමව්පියන්ගේ ආර්ථික මට්ටම**

ජ්‍යෙෂ්ඨ ද්විතීයික ශ්‍රේණිවල සිසුන් ඉංග්‍රීසි විෂය කෙරෙහි දක්වන ආකල්පයන් ගොඩනැගීම කෙරෙහි සමාජ, ආර්ථික හා පාරිසරික යන සාධක කෙතරම් දුරට බලපෑම් කරන්නේ ද යන්න විමර්ශනයට ලක් කරන ලදී.

නියැදියට අදාළ දෙමාපියන්ගේ ආර්ථික මට්ටම පිළිබඳ විමසීම සඳහා මවගේ හා පියාගේ රැකියා මට්ටම් පිළිබඳ තොරතුරු ප්‍රශ්නාවලි ඔස්සේ ලබා ගන්නා ලදී.




ප්‍රස්තාරය 5 - දෙමව්පියන්ගේ ආර්ථික මට්ටම

ප්‍රස්තාරය 5ට අනුව දෙමව්පියන්ගේ ආර්ථික මට්ටම් හඳුනාගත හැකි ය. ඒ අනුව දෙමාපියන්ගෙන් 36%කට ම රැකියාවක් නොමැත. ගොවිතැන් කොට 46%ක් ජීවිකාව ගත කරති. එම දෙමාපියන් උක් හා හේන් ගොවිතැනෙහි නිරත වෙති. ඒවා මහා පරිමාණයෙන් කරනු ලබන ගොවිබිම් නොවන බවත් අනාවරණය විය.

මීට අමතර ව පෞද්ගලික ආයතනික රැකියා කරන පිරිස 14%ක් විය රජයේ රැකියාවල නියුතු පිරිසෙහි ප්‍රතිශතය 4%කි. ඒ අනුව ඉහළ ආර්ථික හැකියාවක් සහිත දෙමාපියන්ගේ දරුවන් මෙම පාසල් තුළ අධ්‍යාපනය නොලබති.

### දෙමාපියන්ගේ අධ්‍යාපන මට්ටම

ශිෂ්‍යයන්ගේ අධ්‍යාපන සාධන මට්ටම සංවර්ධනය උදෙසා බලපෑම් කිරීමට සමත් සාධකයක් ලෙස, දෙමාපියන්ගේ අධ්‍යාපන මට්ටම පෙන්වා දිය හැකි ය. ඒ නිසාවෙන් දෙමාපියන්ගේ අධ්‍යාපන මට්ටම කෙබඳු දැ'යි විශ්ලේෂණයට බඳුන් කරන ලදි.

වගුව 2ට අනුව උපාධිධාරී දෙමාපියන්ගේ දරුවෝ කිසිවෙකුත් මෙම පාසල් තුළ අධ්‍යාපනය නො ලබති. අ.පො.ස. (උ.පෙළ) සමත් දෙමාපියන්ගේ ප්‍රතිශතය 05%කි. අ.පො.ස (සා.පෙළ) සමත් දෙමාපියන්ගේ ප්‍රතිශතය 56%කි. 05 ශ්‍රේණිය සමත් දෙමාපියන්ගේ ප්‍රතිශතය 31%කි. 08%ක ප්‍රතිශතයක පිරිසක් 05 ශ්‍රේණිය ද අසමත් ය.

මූලාශ්‍රය - ක්ෂේත්‍ර අධ්‍යයනය, 2025

ඒ අනුව පැහැදිලි වන්නේ ඉහළ අධ්‍යාපනයක් සහිත දෙමාපියන්ගේ දරුවන් මෙම පාසල් තුළ අධ්‍යාපනය නොලබන බව යි.

### ■ ගුරුවරුන්ගේ වෘත්තීය ස්වභාවය

ඉගෙනුම කෙරෙහි ප්‍රධාන බලපෑම් සහගත සාධකයක් ලෙස ගුරුවරයාගේ වෘත්තීය සුදුසුකම් පෙන්වා දිය හැකි ය. එනිසාවෙන් ගුරුවරයාගේ පත්වීමේ ස්වභාවය කෙබඳුදැයි විමර්ශනයට ලක් කෙරිණි. එහි දී ලබාගත් දත්තයන් පහත ප්‍රස්තාරය 6 පරිදි දැක්වේ. ඒ අනුව 60%ක ප්‍රතිශතයක පිරිසක් ඉංග්‍රීසි ගුරුවරුන් ලෙස පත් ව ඇත්තේ උසස් ජාතික ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව සම්පූර්ණ කිරීමෙනි. ඉතිරි 40% ක් පත්ව ඇත්තේ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව සම්පූර්ණ කළ පිරිසගෙනි. අධ්‍යයනය සඳහා යොදාගත් නියැදියට අනුව උපාධිධාරී ගුරුවරුන් ලෙස ගුරු සේවයට පැමිණි ඉංග්‍රීසි ගුරුවරුන් නොමැත.




ප්‍රස්තාරය 6 - ගුරුවරුන්ගේ වෘත්තීය ස්වභාවය

වගුව 2 - දෙමාපියන්ගේ අධ්‍යාන මට්ටම

| | උපාධිධාරී | අ:පො:ස: (උ:පෙළ) සමත් | අ:පො:ස: (ස:පෙළ) සමත් | 5 ශ්‍රේණිය සමත් | 5 ශ්‍රේණිය අසමත් |
|---|---|---|---|---|---|
| මව | 0 | 3 | 52 | 20 | 5 |
| පියා | 0 | 4 | 38 | 30 | 8 |
| ප්‍රතිශතය | 0% | 5% | 58% | 31% | 8% |

ඒ අනුව අනාවරණය වන්නේ ග්‍රාමීය පාසල්වල ඉංග්‍රීසි විෂය ඉගැන්වීම සඳහා පත්වන ගුරුවරුන්ගෙන් වැඩි පිරිසකගේ පත්වීමේ ස්වභාවය වන්නේ උසස් අධ්‍යාපන ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව වන බව යි.

■ **ගුරුවරුන්ගේ ගුරු සේවයේ පරිණතභාවය**

යම් විෂයක සංවර්ධනය කෙරෙහි බලපෑම් සහගත සාධකයක් ලෙස වෘත්තීය පරිණතභාවය පෙන්වා දිය හැකි ය. ඒ පිළිබඳ ලබාගත් දත්ත පහත වගුව 03න් දක්වා ඇත.

වගුව 3 - ගුරුවරුන්ගේ ගුරු සේවයේ පරිණතභාවය

| ගුරුවරයා | ගුරු සේවයේ යෙදී සිටි කාල සීමාව |
|---|---|
| **A** පාසල් ගුරුවරයා | වසර 02 |
| **B** පාසල් ගුරුවරයා | වසර 08 |
| **C** පාසල් ගුරුවරයා | වසර 05 |
| **D** පාසල් ගුරුවරයා | වසර 12 |
| **E** පාසල් ගුරුවරයා | වසර 03 |

මූලාශ්‍රය - ක්ෂේත්‍ර අධ්‍යයනය, 2025

ඒ අනුව තෝරාගත් ගුරු නියැදියේ, ගුරු සේවයේ වසර පහකට වඩා අඩුවෙන් සේවයේ නියුතු ගුරුවරුන් සිටින්නේ තිදෙනෙකු පමණි. එය ප්‍රතිශතයක් ලෙස 60%කි. අනෙකුත් ගුරුවරුන් පිළිවෙළින් වසර 8, 12 සේවය කළ ගුරුවරු වෙති. එය ප්‍රතිශතයක් ලෙස ගත් විට 40%කි.

මේ අනුව පැහැදිලි වන්නේ ගුරු සේවයේ වසර පහකට වඩා වැඩි පළපුරුද්ද සහිත ඉංග්‍රීසි විෂය උගන්වනු ලබන ගුරුවරුන් ග්‍රාමීය පාසල් තුළ අඩු බව යි.

**ඉංග්‍රීසි විෂය උගන්වන ගුරුවරුන් භාවිත කරන ඉගැන්වීම් ක්‍රමවේද**

ඉංග්‍රීසි විෂය ඉගෙනුම කෙරෙහි ඉගෙනුම් ක්‍රමවේදයන් බලපාන හෙයින් ගුරුවරුන් කවර ආකාරයේ ඉගෙනුම් ක්‍රමවේදයන් භාවිත කරන්නේද යන්න අධ්‍යයනය මෙහි දී සිදු කෙරිණි මේ පිළිබඳව නියැදිය ඔස්සේ ලබාගත් තොරතුරු පහත පරිදි ය.

වගුව 4 - ඉංග්‍රීසි විෂය උගන්වන ගුරුවරුන් භාවිත කරන ඉගැන්වීම් ක්‍රමවේද

| ක්‍රමවේදය / ගුරුවරයා | දේශන ක්‍රමය | කණ්ඩායම් ක්‍රමය | දේශන-සාකච්ඡා ක්‍රමය | ප්‍රශ්නකරණය | වෙනත් |
|---|---|---|---|---|---|
| *A* පාසල් ගුරුවරයා | | √ | √ | | |
| *B* පාසල් ගුරුවරයා | | √ | √ | √ | |
| *C* පාසල් ගුරුවරයා | √ | √ | √ | | |
| *D* පාසල් ගුරුවරයා | | √ | √ | | |
| *E* පාසල් ගුරුවරයා | | √ | √ | √ | |

මූලාශ්‍රය - ක්ෂේත්‍ර අධ්‍යයනය, 2025

ඒ අනුව වගුව 4න් අනාවරණය වන්නේ, බහුල ලෙස ගුරුවරුන් ඉංග්‍රීසි විෂය ඉගැන්වීම සඳහා දේශන-සාකච්ඡා ක්‍රමය හා කණ්ඩායම් ක්‍රමය භාවිත කරන බව යි. දේශන ක්‍රමය හා ප්‍රශ්නකරණය ද ඇතැම් අවස්ථාවල භාවිත කරති.

■ **ගුරුවරුන් යොදාගන්නා ඉගැන්වීම් ක්‍රමවේදවලට ශිෂ්‍යයන් දක්වන ප්‍රතිචාර**

මෙහි දී ගුරුවරයා යොදා ගන්නා ඉගැන්වීම් ක්‍රමවේදයට ශිෂ්‍යයන් දක්වන ප්‍රතිචාර ප්‍රස්තාරය 7 පරිදි දැක්විය හැකි ය.




ප්‍රස්තාරය 7 - ගුරුවරයා යොදාගන්නා ඉගැන්වීම් ක්‍රමවේදවලට ශිෂ්‍යයන් දක්වන ප්‍රතිචාර

ප්‍රස්තාරය 7ට අනුව ගුරුවරයාගේ ඉගෙනුම්

ක්‍රමවේදයට ඉතා කැමති හෝ ඉතා අකමැති සිසුන් නොවීය. ගුරුවරයාගේ ඉගැන්වීම් ක්‍රමවේදයට අකමැති සිසුන් සිටියේ 11%ක් පමණි. 39%ක ප්‍රමාණයක් ගුරුවරයාගේ ඉගැන්වීම් ක්‍රමවේදයට කැමති බව දක්වා ඇත. සිසුන්ගෙන් 50% ක පිරිසක් මධ්‍යස්ථ ව සිටී.

ඒ අනුව පැහැදිලි වන්නේ පන්තියේ සිසුන්ගෙන් වැඩි පිරිසක් ගුරුවරයාගේ ඉගැන්වීම් ක්‍රමවේදයට මධ්‍යස්ථ කැමැත්තක් දක්වන බව යි.

**■ ඉංග්‍රීසි විෂය ඉගැන්වීමේ දී ඉගෙනුම් ආධාරක භාවිතය**

මෙහි දී අධ්‍යයනය කරන ලද දත්තයන්ට අනුව ගුරුවරුන් සියලු දෙනා ම ප්‍රකාශ කර සිටියේ ඉගැන්වීමේ දී ඉගෙනුම් ආධාරක භාවිත කරන බව යි. එහි දී ලැබුණු ප්‍රතිචාර ප්‍රස්තාරය 8 න් දක්වා ඇත.




ප්‍රස්තාරය 8 - ඉංග්‍රීසි විෂය ඉගැන්වීමේ දී ඉගෙනුම් ආධාරක භාවිතය

මෙම දත්තවලට අනුව, 60%ක ප්‍රතිශතයක් ඉගෙනුම් ආධාරක කලාතුරකින් භාවිත කරති. ඉගෙනුම් ආධාරක බොහෝ විට භාවිත කරනුයේ 40%ක පිරිසකි.

ඒ අනුව අනාවරණය වන්නේ ඉංග්‍රීසි විෂය ඉගැන්වීමේ දී ඉගෙනුම් ආධාරක භාවිතය තරමක් අඩු බව යි.

**■ ගුරුවරුන් විසින් ශිෂ්‍යයන්ගේ විෂය සාධනය මනින ආකාරය**

වගුව 5ට අනුව ගුරුවරු ලිඛිත හා වාචික යන ක්‍රම දෙක භාවිතයෙන් ශිෂ්‍යයන්ගේ ඉංග්‍රීසි විෂය සාධනය මැනීම සිදු කරති. එහි දී වාචික ක්‍රම භාවිත කරමින් පරීක්ෂණ සිදු කරනු ලබන්නේ 40%ක පිරිසකි. 60%ක පිරිසක් වාචික පරීක්ෂණ නොපවත්වති. එහෙත් 100%ක ම පිරිස ලිඛිත ක්‍රම මගින් පරීක්ෂණ පවත්වති. මාසික පරීක්ෂණ සිදු කරනු ලබන්නේ 20%ක ගුරුවරුන් පිරිසක් පමණි. ඒ අනුව ශිෂ්‍ය සාධනය මැනීම ලිඛිත හා වාචික වශයෙන් වාර පරීක්ෂණ ඔස්සේ සිදු කරන බව අනාවරණය විය.

වගුව 5 - ශිෂ්‍යයන්ගේ විෂය සාධන මට්ටම මැනීම

| පාසල | ස්වභාවය අනුව පරීක්ෂණ | | කාලය අනුව පරීක්ෂණ | | | |
|---|---|---|---|---|---|---|
| | ලිඛිත | වාචික | දෛනික | සති | මාසික | වාර |
| A | √ | | | | | √ |
| B | √ | √ | | | √ | √ |
| C | √ | | | | | √ |
| D | √ | √ | | | | √ |
| E | √ | | | | | √ |

මූලාශ්‍රය - ක්ෂේත්‍ර අධ්‍යයනය, 2025

**■ විෂයයට අදාළ ව ශිෂ්‍යයන්ට ප්‍රතිපෝෂණ ලබා දීම**

මෙහි දී නියැදියෙන් ලැබුණු ප්‍රතිඵල අනුව ගුරුවරුන්ගෙන් වැඩි පිරිසක් ශිෂ්‍යයන් සඳහා විෂයයට අදාළ ව ප්‍රතිපෝෂණය ලබා නොදෙන බව අනාවරණය විය. එක් පාසලකින් පමණක් ප්‍රතිපෝෂණ ලබා දෙයි. එය වගුව 6න් පැහැදිලි වේ.

ඉංග්‍රීසි භාෂා ඉගෙනීමට දැඩි ලෙස බලපාන කරුණක් ලෙස මෙම ප්‍රතිපෝෂණ

ලබා දීම හඳුනාගත හැකි ය. ඇගයීම සිදු කර එහි ප්‍රතිඵල භාවිතයෙන් ශිෂ්‍යයන්ට ප්‍රතිපෝෂණයක් ලබා දීම ඉගෙනීම සංවර්ධනයට බෙහෙවින් ඉවහල් වේ. එහෙත් මෙම පාසල්වල එය නිවැරදි ව ක්‍රියාත්මක නො වේ.

වගුව 6 - විෂය අදාළ ප්‍රතිපෝෂණ ලැබෙන්නේද? යන්න අධ්‍යයනය

| | A පාසල | B පාසල | C පාසල | D පාසල | E පාසල |
|---|---|---|---|---|---|
| ප්‍රතිපෝෂණ ලබා දේ | | √ | | | |
| ප්‍රතිපෝෂණ ලබා නොදේ | √ | | √ | √ | √ |

මූලාශ්‍රය - ක්ෂේත්‍ර අධ්‍යයනය, 2025

### ▪ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම සඳහා සිටින ගුරුවරුන්ගේ ප්‍රමාණාත්මක බව

නියැදියේ පාසල්වල විදුහල්පතිවරුන්ගේ සම්මුඛ සාකච්ඡා ඔස්සේ ලබා ගත් තොරතුරු පහත වගුව 7 පරිදි දැක්විය හැකි ය. ඒ අනුව පාසල තුළ ඉංග්‍රීසි විෂය ඉගැන්වීම සඳහා ගුරුවරුන් ප්‍රමාණවත් බව පැවසූයේ විදුහල්පති නියැදියෙන් එක් අයෙකු පමණි. අනෙක් විදුහල්පතිවරුන් සියලු දෙනාම ප්‍රකාශ කර සිටියේ ඒ සඳහා ප්‍රමාණවත් ගුරුවරුන් නොසිටින බවයි.

වගුව 7 - පාසල් සඳහා අවශ්‍ය ගුරුවරුන්ගේ ප්‍රමාණාත්මක බව

| ගුරුවරුන් ප්‍රමාණාත්මක බව | A පාසල | B පාසල | C පාසල | D පාසල | E පාසල |
|---|---|---|---|---|---|
| ප්‍රමාණවත් වේ | | | | √ | |
| ප්‍රමාණවත් නොවේ | √ | √ | √ | | √ |

මූලාශ්‍රය - ක්ෂේත්‍ර අධ්‍යයනය, 2025

ඒ අනුව පැහැදිලි වන්නේ ග්‍රාමීය පාසල්වල ඉංග්‍රීසි විෂය ඉගැන්වීම සඳහා ප්‍රමාණවත් ගුරුවරුන් පිරිසක් නොසිටින බව යි.

### ඉංග්‍රීසි විෂය ඉගෙනුමෙහි සාර්ථකත්වය සඳහා ගතහැකි ක්‍රියාමර්ග

ප්‍රශ්නාවලියෙන් හා සම්මුඛ සාකච්ඡාවෙන් ලබාගත් දත්ත වාර්තාවන්ට අනුව ග්‍රාමීය පාසල්වල ජ්‍යෙෂ්ඨ ද්විතීයික සිසුන්ගේ ඉංග්‍රීසි විෂය ඉගෙනුමෙහි සාර්ථකත්වය සඳහා පාසල් ගුරුවරුන් සහ ක්ෂේත්‍ර බලධාරීන් පර්යේෂණ යෝජනා ක්‍රියාත්මක කළ යුතු ය.

- පාසල් මට්ටම තුළ දී අසමත් වන මට්ටමේ සිටින ශිෂ්‍යයන් සමත් මට්ටමට ගෙන යාම සඳහා පාසල් මට්ටමින් ක්‍රියාත්මක කිරීමට විෂය සංවර්ධන ව්‍යාපෘතියක් යෝජනා කළ හැකි ය.

- ශිෂ්‍යයන්ගේ විෂය සහභාගීත්වය සහ විෂය රුචිකත්වය ඉහළ නංවා ගැනීමට කටයුතු කළ යුතු අතර ඒ සඳහා තාක්ෂණය, ක්‍රීඩා ක්‍රමවේද, ඉදිරිපත් කිරීම් වැනි ඉගෙනුම් ක්‍රම ශිල්ප භාවිත කළ හැකි ය.

- ගුරුවරයා පෙළ පොතටම සීමා නොවී දරුවන්ගේ ප්‍රායෝගික ජීවිතයට වැදගත් ඉංග්‍රීසි වචන, දෙබස් කාණ්ඩ ඉගැන්වීමෙන් දරුවන් එදිනෙදා ඉංග්‍රීසි භාවිතයට හුරු කිරීම සිදු කළ හැකි ය.

- ඉංග්‍රීසි විෂයයට වටිනාකමක් ඇති බව නිරන්තරයෙන් දරුවන්ට ඒත්තු ගැන්විය යුතු ය. මේ සඳහා ඉංග්‍රීසි භාෂාවේ වැදගත්කම නිරූපණය කෙරෙන චිත්‍රපට ආදිය දරුවන්ට පෙන්විය හැකි ය. එසේ ම ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සමත්කම් දක්වන දරුවන්ට පාසලේ පිළිගැනීමක් ලබා දෙමින් දිරිගැන්වීමක් කළ හැකි ය.

- ශිෂ්‍යයන්ගේ ඉංග්‍රීසි විෂය සාධනය මැනීම වාර විභාගවලට පමණක් සීමා

නොවී ලිඛිත, කථන, සවන් දීම සහ කියවීම යන චතුර්විධ භාෂා කුසලතා මැනීමට අවශ්‍ය වැඩ පිළිවෙළක් විෂය භාර ගුරුභවතුන් විසින් ක්‍රියාත්මක කළ යුතු ය. එලෙස ශිෂ්‍ය සාධනය මැනීමෙන් ඒ ඒ ශිෂ්‍යයන්ට සුදුසු ප්‍රතිපෝෂණ ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතු වේ. එහි දී ශිෂ්‍යයන් වර්ග කිරීමකින් යුතු ව ප්‍රතිපෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වඩා ප්‍රතිඵලදායි වේ.

- ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරුවරුන් නිරන්තරයෙන් ඉගෙනුම් ආධාරක භාවිත කරන්නේ නම් එයින් විෂය හැකියාවන් සංවර්ධනයට රුකුලක් වේ.
- ශිෂ්‍යයන්ගේ ඉංග්‍රීසි භාෂා සංවර්ධනයට මුල් ළමා වියේ අධ්‍යාපනයේ සිට ම අනිවාර්ය අඩිතාලමක් ලැබෙන පරිදි සහ අඛණ්ඩ ව පවත්වාගෙන යා හැකි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම සුදුසු ය.
- පාසල් තුළ ඉංග්‍රීසි ගුරුභවතුන්ගේ මූලිකත්වයෙන් ශිෂ්‍යයන්හට ඉංග්‍රීසි භාෂාව සරල මට්ටමේ සිට ඉගෙන ගැනීමට අවස්ථාව සැලසෙන ලෙස ඉංග්‍රීසි වැඩමුළු ආරම්භ කිරීම සුදුසු ය.
- පාසල් තුළ පවතින මානව හා භෞතික සම්පත්වල අඩුව පිරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග රජය විසින් ගත යුතු ය.

## නිගමනය

ග්‍රාමීය පාසල්වල ජ්‍යෙෂ්ඨ ද්විතීයික සිසුන්ගේ ඉංග්‍රීසි විෂය ඉගෙනුම කෙරෙහි බලපාන ගැටලු පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයෙන් සිදු කර ඇත. ග්‍රාමීය පාසල්වල ජ්‍යෙෂ්ඨ ද්විතීයික ශ්‍රේණිවල සිසුන්ගේ ඉංග්‍රීසි අධ්‍යාපන සාධනය සමස්තයක් ලෙස දුර්වල මට්ටමක පවතින බවත්, ඊට හේතු ලෙස ප්‍රධාන වශයෙන් සිසුන්ගේ පවත්නා සෘණාත්මක ආකල්ප, ඉගැන්වීම් ක්‍රමවල පවත්නා දුර්වලතා, සමාජ පරිසරයේ බලපෑම මෙන් ම මානව හා භෞතික සම්පත්වල හිඟකම ආදිය හේතු වී ඇති බවත් අනාවරණය විය. මේ අනුව ග්‍රාමීය පාසල්වල ළමයින් ඉංග්‍රීසි භාෂා විෂය ඉගෙනීමේ දී විවිධ වූ ගැටලුවලට මුහුණ පාන බවත්, එම ගැටලු සඳහා සමාජ, ආර්ථික හා පාරිසරික යන විවිධ හේතු බලපාන බවත් නිගමනය කළ හැකි ය.

## මූලාශ්‍රය


අබේපාල, ආර්. (2010). *අධ්‍යාපනයේ මනෝවිද්‍යාත්මක පදනම.* කොට්ටාවා: සාර ප්‍රකාශන

පෙරේරා, එල්. (1991). *විස්තරාත්මක අධ්‍යාපනික සංඛ්‍යානය.* කොට්ටාවා: සාර ප්‍රකාශන

මැණිකේ, එන්. (2002). *ඉංග්‍රීසි භාෂාව සාර්ථකව ඉගෙනීමට යොමු කිරීම.* මහරගම: ජාතික අධ්‍යාපන ආයතනය

රණසිංහ, ආර්. (1997). *අවිධිමත් අංශයේ ඉංග්‍රීසි භාෂා ඉගැනීමේ පංති කාමර සම්බන්ධිත සිද්ධි අධ්‍යයන තුනක්.* මහරගම: ජාතික අධ්‍යාපන ආයතනය

රුබේරු, ආර්. (2004). *ශ්‍රී ලංකා ජාතික අධ්‍යාපන ගැටලු.* වැල්ලම්පිටිය: චතුර මුද්‍රණාලය

රූපසිංහ, එස්. (2004). *අධ්‍යාපන පර්යේෂණ මෙවලම් මූලධර්ම සහ භාවිතය.* කොළඹ: සරසවි ප්‍රකාශකයෝ

Department of Examinations - Sri Lanka. (n.d.). *Evaluation reports*. https://www.doenets.lk/evaluationreports

Gunawardena, N., Seneviratne, R. de A., & Jayawardana, P. L. (2015). *Feasibility of introducing general English as a university entry requirement for medicine: Results of a national survey*. ResearchGate. https://www.researchgate.net/publication/273687379_Feasibility_of_Introducing_General_English_as_a_University_Entry_Requirement_for_Medicine_Results_of_a_National_Survey

Wikipedia. (2024, May 15). GCE Ordinary Level in Sri Lanka. In *Wikipedia*. https://en.wikipedia.org/wiki/GCE_Ordinary_Level_in_Sri_Lanka

Wikipedia. (2024, May 15). February 25. In *Wikipedia*. https://en.wikipedia.org/wiki/February_25